www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා ආන්ඩුව බරපතල මූල්‍ය අර්බුදයක

## Sri Lankan government deeply mired in financial difficulties

**සමන් ගුනදාස විසිනි**
**2004 ජුනි 3**

අප්‍රේල් 02 දා පැවති මැතිවරනයෙන් මාස දෙකක් ගතවෙත් ම අලුතෙන් පත් වූ සුලුතර ආන්ඩුව බරපතල මුදල් ගැටලුවකට මුහුන පා සිටී. එවකට පැවති එක්සත් ජාතික පෙරමුනු රජය පෙරලා දැමීම සඳහා රැකියා දීම්, වැටුප් වැඩි කිරීම් සහ ගොවීන්ට සහන දීම් වැනි ජනප්‍රිය පොරොන්දු වැලක් එක්සත් ජනතා නිදහස් සන්ධානය (එජනිස) විසින් ප්‍රකාශ කරන්නට යෙදුනි. දැන්, එජනිසයේ ඇමතිවරු, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ලෝක බැංකුවේ නිර්දේශ ඉෂ්ට කිරීම සඳහා, මහා ව්‍යාපාර සහ විදේශ ආයෝජකයන්ගේ තදබල පීඩනයට හසුවී ඇත.

මැයි 16 *සන්ඩේ ටයිම්ස්* පුවත් පතේ පල වූ ලිපියක රජයේ මූල්‍යමය තත්වය ප්‍රධාන කොට දක්වා තිබිනි. ''රාජ්‍ය සංස්ථා සහ අනෙකුත් ව්‍යවස්ථාපිත මන්ඩලවලට වැටුප් ගෙවීමට තරම් වත් මුදල් නොමැත. මේ සතියේ දී ලංවිම තම අරමුදල් ගොඩනැගීම සඳහා, භාන්ඩාගාර ප්‍රතිපාදන ප්‍රතික්ෂේප කෙරුනු ලංකා ඛනිජ තෙල් සංස්ථාව කල ලෙසට ම, රාජ්‍ය බැංකුවලට ආයාචනා කරමින් සිටී.

එජනිස රජය අත්‍යවශ්‍ය භාන්ඩවල මිල ඉහල යාම වැලැක්වීම සඳහා ඉතා දුෂ්කර කටයුත්තකට නියැලී සිටින නමුත් එහි ප්‍රතිඵල ලෙසට ආධාර සැපයීම්වල දී කඳුගැසෙන ගැටලුවලට මුහුන පායි. ඛනිජ තෙල් බැරලයක මිල ඇ.ඩො. 40කින් ඉහල නැගීමත් සමග ම, රජයට අයත් ඛනිජ තෙල් සංස්ථාවටත් (සිපෙට්කෝ) ලංකා-ඉන්දීය තෙල් සමාගමටත් (එල්අයිඕසී) සහන සැපයීම් ගාස්තු ලෙස රුපියල් බිලියන ගනනක් ගෙවීමට රජයට සිදු වී ඇත. මේ වසරේ පලමු මාස හතරේ දී, රජය විසින් සිපෙට්කෝ වෙත ගෙවිය යුතු හිඟ මුදල රුපියල් බිලියන 2.5 (ඇඩො මිලියන 25)කුත් ලංකා-ඉන්දීය තෙල් සමාගමට රුපියල් මිලියන 650කුත් විය.

තිරිඟු පිටි විකිනීම සඳහා ඒකාධිකාරයක් ඇති, සිංගප්පූරුවේ ස්ථාපිත බහුජාතික සමාගමක් වන ප්‍රීමා සිලෝන් සමාගමෙනුත් රජයට පීඩනය එල්ල වී ඇත.

පාරිභෝගිකයාට සහන මිලට පිටි සැපයීමේ ගාස්තු වසයෙන් රුපියල් බිලියන 1.2ක් සමාගමට රජය විසින් ගෙවනු නො ලැබුව හොත් සියයට 20කින් පිටි මිල ඉහල දමන බවට ප්‍රීමා සමාගම රජයට අනතුරු අඟවා ඇත. මොනයම් ආකාරයේ හෝ මිල වැඩි වීමකට එල්ල විය හැකි මහජන විරෝධයකට බියෙන්, පාරිභෝගික සේවා ඇමති ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ, පාරිභෝගික ආරක්ෂක පනත යටතේ තිරිඟු පිටි අත්‍යවශ්‍ය ද්‍රව්‍යයක් බවට ප්‍රකාශයට පත් කොට, වෙලඳ පොල තරගකාරීත්වයට විවෘත කරන ලදි.

ඒ හා සමග ම, ආදායම් පිරිහීමකට රජය මුහුන පා සිටී. පලමු මාස දෙකෙහි ආදායම් එකතුව රුපියල් බිලියන 45.8ක් විය. එය සියයට 11.41ක අඩු වීමකි. ඒ සමග ම රජයේ වියදම් සියයට 3.1කින් ඉහල ගියේ ය. එනම් රුපියල් බිලියන 78.6කි.

මේ වන තෙක් ලබාදුන් එකම මැතිවරන පොරොන්දුව වූයේ, එජාපෙ රජය විසින් කපා හැරුනු පොහොර සහනාධාරය නැවත ලබාදීම පමනි. මෙම කාරනය විශේෂයෙන් ම වැදගත් වනුයේ, ග්‍රාමීය ඡන්ද ඉතා වැදගත් වන පලාත් සභා හතරක මැතිවරනයකට, එජනිසයේ ප්‍රධාන පක්ෂ, ශ්‍රීලනිප සහ ජවිපෙ, මුහුන පා සිටින බැවිනි. නමුත්, රජයට රුපියල් බිලියන 3ක් වැය වුනු පොහොර සහනාධාරය නැවත ස්ථාපිත කිරීම, සුලු ගොවීන් මුහුන පා සිටින ගැටලුවලට ප්‍රමානවත් පිලිතුරක් නො වේ.

විරැකියාවෙන් පෙලෙන උපාධිධාරීන් 60,000කට වහාම රැකියා ලබාදීමට එජනිස පොරොන්දු වූයේ ය. මාසිකව රු. 6000ක (ඇ.ඩො. 60) දීමනාවකට පුහුනුවන්නන් ලෙස බඳවා ගැනීමට 27,000ක් ලෙස ඇස්තමේන්තු කල උපාධිධාරීන් පිරිසකගෙන් රජය විසින් ඉල්ලුම්පත් කැඳවනු ලැබ තිබේ. මෙම සීමිත වැඩපිලිවෙල පවා තවමත් ඉටුවිය යුතුව ඇති අතර වෙනත් රැකියා සැලසුම් පසෙක දමා ඇත. රැකියා 60,000ක් සඳහා වාර්ෂික වියදම රු. බිලියන 6කි. සියයට 75කින් රජයේ වැටුප් වැඩිකිරීමට එජනිස පොරොන්දු විය. ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල වර්ෂයකට රුපියල් බිලියන 90ක් පමන වේ. මෑතක දී කල පුවත් පත් සාකච්ඡාවක දී, භාන්ඩාගාර ලේකම් පී.බී. ජයසුන්දර ප්‍රකාශ කලේ මොනයම් හෝ වැටුප් වැඩිකිරීමක් සලකා බැලිය හැක්කේ ලබන නොවැම්බරයේ දී ප්‍රකාශයට පත් කිරීමට නියමිත මීලඟ අයවැයේ දී බව ය.

අයවැය පරතරයේ මොනයම් හෝ ඉහල යෑමකට විරුද්ධව ජාමූඅ සහ ලෝක බැංකුව අනතුරු හඟවා ඇත. මේ වසරේ අයවැය හිඟය දල ජාතික නිෂ්පාදනයෙන් සියයට 7.3කට ලඟාවීමට ඉඩ ඇති බවට දැනටමත් අනාවැකි පලකර ඇත. ලෝක බැංකුවේ ශ්‍රී ලංකා නියෝජිත පීටර් හැරල්ඩ් මෑතක දී

ප්‍රකාශ කලේ, වැඩි සුබසාධක වියදම් සම්බන්ධව තම ආයතනය විරුද්ධ නො වන බව ය. පහත ප්‍රකාශය ද ඔහු එයට ඇතුලත් කලේ ය. ''නමුත් ඒවා අන්තර්ගත කිරීම නිසා මූල්‍ය පරතරය සියයට 2-3කින් වැඩි වන්නේ නම් එය ගැටලුවකි. මෙම මූල්‍ය රාමුවේ පවතින්නට නම්, වැඩි වන වියදම් පියවා ගැනීමට ආදායම් වැඩියෙන් උපයා ගත යුතු ය. නමුත් ආදායම් එකතු කිරීම් තවත් නරක අතට හැරෙමින් පවතින අතර එය මේ වසරේ බලාපොරොත්තු වූ අගයට වඩා වැඩිමනත් පහලට ගොස් ඇත.''

'' මෙම දැවැන්ත වියදම් උද්ධමනික පීඩනය වැඩි කල හැකි බවටත් එය පොලී අනුපාත ඉහල යාමට තුඩු දිය හැකි බවටත් ව්‍යාපාරික නියෝජිතයෝ අනතුරු අඟවති. ලංකාවේ ප්‍රධානතම බැංකුවලින් එකක් වන හැටන් නැෂනල් බැංකුව පසුගිය සතියේ ප්‍රකාශ කලේ, ''මෙම වියදම් පියවා ගන්නට අරමුදල් සොයා ගන්නේ කෙසේ දැයි රජයේ බලාපොරොත්තු පිලිබඳව පැහැදිලිභාවය මඳ බැවින් එය වෙලඳ පොල තත්වයන්ට බලපෑම් එල්ල කරන බවත් පොලී අනුපාතවල ඉහල යෑමකට ඉන් මහත් බලපෑමක් ඇති විය හැකි බවත් ය.''

පසුගිය සතියේ ලංකාවට පැමිනි ජාමූඅ කන්ඩායම රජයට අවධාරනය කර සිටියේ, ආර්ථික ප්‍රතිසංස්කරන ඉදිරියට කරගෙන යෑම පිලිබඳ අවිනිශ්චිතතාවයන්ට රජය තවදුරටත් ඉඩ නො තැබිය යුතු බව යි.

මූල්‍ය සහ විදුලි බල අංශ ප්‍රතිව්‍යුහගත කිරීමේ ආන්ඩුවේ සැලැස්ම මේ මාසය තුල ප්‍රකාශයට පත්කල යුතු බව ජාමූඅ කන්ඩායමේ ප්‍රධානි ජෙහන්ගිර් අසීස් පසුගිය බ්‍රහස්පතින්දා රොයිටර් ප්‍රවෘත්ති සේවයට පැවසී ය. තම ඉල්ලීම් ඉටු නො කලහොත් අරමුදල් නිදහස් නො කරන බවට ජාමූඅ තර්ජනය කරයි.

කුමාරතුංග විසින් එජාපෙරමුනු ආන්ඩුවේ මූලික ඇමති තනතුරු තුනක් අත්පත් කරගැනීමෙන් උත්සන්න වූ දේශපාලන අර්බුදයෙන් පසුව, තුන් අවුරුදු ඇඩො මිලියන 567 නය සැලැස්මේ දෙවන වාරිකය වන ඇඩො මිලියන 80 නිකුත් කිරීම ගිය නොවැම්බරයේ දී නවතා ඇමිනි. මෑතක දී කල සංචාරයෙන් පසු, අසීස් මාධ්‍යවලට පැවසුවේ, ''මීලඟ නය වාරිකය නිකුත් කිරීමට ප්‍රථම කුමක් සිදු වන්නේ ද යන්න ගැන අප විමසිල්ලෙන් සිටින්නේ ය'' යනුවෙනි.

රජය දැනටමත් අමතර නය වැඩි කර ගැනීමට පටන් ගෙන ඇත. මේ වසරේ ඉදිරි කාලයේ වියදම් පියවා ගැනීම වෙනුවෙන් රු. මිලියන 250ක නය මුදලක් විදේශ විනිමය වෙලඳ පොලින් වාරික වසයෙන් ලබා ගැනීමට මහ බැංකුව තීරනය කර තිබේ. ශ්‍රී ලංකා ටෙලිකොම්, ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් සහ අනෙකුත් සමාගම්වල ඉතිරි ආන්ඩුවේ කොටස් විකුනා ඇමීමට මුදල් ඇමති සරත් අමුනුගම මාර්තු මැද දී යෝජනා කලේ ය.

සාම වැඩපිලිවෙල නැවත පටන් ගැනීමේ කුමාරතුංගගේ හදිසි තීරනය ඇගේ රජයේ මූල්‍යමය ගැටලු සමග අවම තරමින් පාර්ශ්විකව හෝ බැඳී පවතියි. ඇමරිකාව, ජපානය හා යුරෝපීය රටවලින් සැදුම් ලත්, ආධාර දෙන රටවල් කන්ඩායමේ පොරොන්දුවක් වන ඇඩො බිලියන 4.5ක ආධාර පැකේජය, දෙමල විමුක්ති කොටි සංවිධානයේ (එල්ටීටීඊ) සමග සාම සාකච්ඡා නැවත පටන් ගැනීමත්, ප්‍රතිව්‍යුහගත සහ පෞද්ගලිකරන වැඩපිලිවෙල දෘඪතරව ඉදිරියට ගෙනයාමත් සමග රඳා පවතී.

ආධාර දෙන රටවල් කන්ඩායමේ සම්මන්ත්‍රනය මේ දිනවල බ්‍රසල්ස් නුවර දී පැවැත්වේ. සම්මන්ත්‍රනයට පලමුව, අඟහරුවාදා, යුරෝපීය සංගමයේ මාධ්‍ය ප්‍රකාශක, එමා උඩ්වින්, සෘජුවම පවසා සිටියේ සාම වැඩපිලිවෙල ඉදිරියට යාමට සලස්වන්නේ නම්, එම මුදල් සම්භාරය මුදා හැරිය හැකි බව ය. වර්තමාන යුද විරාමය තවමත් පවතින බව දන්නා නමුත් සාම වැඩපිලිවෙල ඉදිරිය කරා ගෙනයෑමට තම අධිෂ්ඨානය ශ්‍රී ලංකාව විසින් පෙන්විය යුතු බව ඇය අවධාරනය කලා ය. සති දෙකකට පෙර ලංකාවට සංචාරයක යෙදුනු ජපාන විශේෂ නියෝජිත යසුෂි අකාෂි ද මෙම අදහස ඉදිරිපත් කලේ ය.

නව රජය බලයට පත්වී දින කීපයකට පසු, ව්‍යාපාර සංවිධානවල එකමුතුවක් වන ඒකාබද්ධ ව්‍යාපාර එකමුතුව (ජේබීඑෆ්) ලේඛනයක් නිකුත් කලේ ය. එම වැඩපිලිවෙලේ ප්‍රමුඛතම මාතෘකාව වූයේ සිවිල් යුද්ධය නිමා කිරීම යි. ඊට සමානව ම 2004 මූල්‍යමය වැඩපිලිවෙල එලිදැක්වූ මහ බැංකුව ප්‍රකාශ කලේ; ''ප්‍රකාශිත ආර්ථික (microeconomic) සහ මූල්‍යමය වර්ධනයන් ලඟා කර ගැනීම වෙනුවෙන්, සාම වැඩපිලිවෙලෙහි අඛන්ඩතාවය සහ දේශපාලන ස්ථාවරත්වය අවශ්‍ය ම සාධක බව ය''.

කෙසේ වුවත්, පෞද්ගලිකරනය හා ආර්ථික ප්‍රතිව්‍යුහගතකිරීම්වලට විරුද්ධව හා සාම වැඩපිලිවෙල විවේචනය කිරීම මගින් වර්ගෝත්තමවාදයට පොහොර යෙදීම යන ප්‍රධාන කුලුනු දෙක මත පිහිටුවා වූ එජනිස, සාම සාකච්ඡා නැවත පටන් ගැනීමට ගන්නා මොනයම් හෝ උත්සාහයක දී වුව තවදුරටත් අස්ථාවරත්වයට පත්වීම සීර බව කිව හැකි ය. රට එල්ටීටීඊයට පාවාදෙන්නේ යැයි එජාපෙරමුනට චෝදනා කල ජවිපෙ, දැනටමත් එල්ටීටීඊය සමග සාකච්ඡාවන්ට පදනම් වන සැලසුම්වලට සිය විරුද්ධත්වය ප්‍රකාශ කර ඇත.

එජා පෙරමුනු රජය යටතේ සිය ජීවන තත්වයන් දරුනු කප්පාදුවකට ලක්වුනු සහ එජනිස රජයක් යටතේ ඒවායෙහි වර්ධනයක් වෙතැයි බලාපොරොත්තු තබා ඇති සාමාන්‍ය වැඩ කරන ජන සමූහයාගෙන් එල්ල විය හැකි තර්ජනය ගැන ආන්ඩුව බිය වී සිටියි. මෑතක දී පලවුනු 2003 වර්ෂයේ මහ බැංකු වාර්තාවට අනුව, ජාමූඅ සහ ලෝක බැංකුවේ අනුදැනුම ඇතිව එජාපෙ විසින් කරගෙන ගිය ආර්ථික ප්‍රතිව්‍යුහගතකිරීම්වල සමාජමය බලපෑම මෙසේ පෙන්නුම් කර ඇත.

2002 වසරේ රු. බිලියන 5.6ක් වූ රාජ්‍ය වැටුප් 2003 වසරේ දී බිලියන 5.2ක් දක්වා අඩු කරමින්, රාජ්‍ය අංශයේ රැකියා සීමා කිරීම.

අලුතෙන් හඳුන්වා දුන් රාජ්‍ය විශ්‍රාම යෝජනා ක්‍රමය යටතේ, සේවක වැටුපෙන් සියයට 8ක් විශ්‍රාම ගිනුමට බැර කරමින් තවත් වැටුප් කප්පාදුවකට ලක් කරන ලදි.

2002, දල ජාතික නිෂ්පාදනයෙන් සියයට 2.4ක් වූ අධ්‍යාපන වියදම්, 2003 දී සියයට 2.2ක් දක්වා කපා හැර ඇත. 2002 දී දජානියෙන් 1.57ක් වූ සෞඛ්‍ය වියදම් 2003 දී 1.56 දක්වා අඩු විය. 2002 දී බිලියන 3කින් කපා හරින ලද සමෘද්ධි සහනාධාර වියදම් 2003 වසරේ දී සියයට 12කින් එනම් රු. බිලියන 8.7 දක්වා කප්පාදුවකට ලක්කර ඇත.

දුම්රිය, බස් සමාගම්, තැපැල් දෙපාර්තමේන්තුව සහ සතොස වෙලඳ සැල් ආදී රජයට අයත් ව්‍යාපාර සඳහා වන අරමුදල් 2003 දී සියයට 29කින් කපා දමමින් එම සේවාවන් සැලකිය යුතු පසුබෑමකට ලක් කරන ලදි.

විශාල සමාගම් සඳහා වූ ආයතනික බදු සියයට 35 සිට සියයට 30 දක්වා අඩු කලේ ය. 2002 දී ඩොලර් මිලියන 197ක් වූ සෘජු විදේශ ආයෝජනයන් 2003 දී ඩොලර් මිලියන 229ක් දක්වා වර්ධනය වීමට එය එක් හේතුවක් විය. එජාපෙ රජය යටතේ 2001 දී දල ජාතික නිෂ්පාදනයෙන් සියයට 10.8ක් වූ අයවැය හිඟය, 2003 දී සියයට 8 දක්වා අඩු විය. ජාමූඅ සහ ලෝක බැංකුව බලකරන්නේ එම සංඛ්‍යාව තව දුරටත් අඩු විය යුතු බව යි. ගිය මාසයේ දී මුදල් ඇමති සරත් අමුනුගම මාධ්‍යයන්ට ප්‍රකාශ කලේ ''අපට අයවැය පියවා ගැනීමේ ගැටලුවක් ඇත. රටට ඔරොත්තු නො දෙන අයුරින් අපි ජීවත් වී ඇත්තෙමු'' යනුවෙනි.

සමාජ අර්බුදයෙන් මහජනතාව ගලවා ගැනීම කෙසේ වෙතත්, දේශපාලන අස්ථාවරත්වය ගැඹුරු වන අයුරින්, බහුතර මහජනයාගේ සමාජ කොන්දේසි තව දුරටත් කාබාසිනියා කිරීමට එජනිස ආන්ඩුව සූදානම් වෙමින් සිටියි.

© www.wsws.org